සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක 12/2020

මගේ අංකය - PPSC/ES/10/FI/02/06-1
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත - රත්නපුර.
2020.07.

විගණන අධ්‍යක්ෂ,
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව,
සබරගමුව පළාත් සභාව.

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ අභ්‍යන්තර විගණන ඒකකයේ අභ්‍යන්තර විගණන නිලධාරී I ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම්පත් කැඳවීම**

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ අභ්‍යන්තර විගණන ඒකකයේ අභ්‍යන්තර විගණන නිලධාරී I ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත්වීම අවශ්‍ය වේ. එබැවින් එම විභාගය සඳහා ඉදිරිපත් වන I ශ්‍රේණියේ අභ්‍යන්තර විගණන නිලධාරීන්ගෙන් මින් අයදුම්පත් කැඳවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයගේ අයදුම්පත් 2020.07.30 වන දිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා මඟින් එවිය යුතුය.

02. මෙම චක්‍රලේඛ ලිපියේ පසු පිටේ සඳහන් ආදර්ශ අයදුම්පත ප්‍රකාර සකස් කරගත් අයදුම්පතක් මඟින් විභාගයට අයදුම් කළයුතු වේ. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන තම ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු ඉදිරියේ අයදුම්කරු අත්සන් කර ඔහුට භාරදිය යුතුය. ආයතන ප්‍රධානියා විසින් එම අයදුම්පත 2020.07.30 දිනට ප්‍රථම ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

03. විභාගයෙන් සමත්වීම සඳහා එක් විෂයයකින් ලකුණු 40% බැගින් ලබාගත යුතුය

04. ලිඛිත පරීක්ෂණය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහයේ II බාණ්ඩය | පැය 02 | 100 | 40 |

(1) ආයතන සංග්‍රහය - ආයතන සංග්‍රහයේ II වන කොටසේ XLVII හා XLVIII වන පරිච්ඡේදවලට අදාළ විනය ක්‍රියා පටිපාටීන් ඇතුලත් සිද්ධි අධ්‍යනයක් මඟින් දැනුම පරීක්ෂා කිරීම, පළමුවන සහ දෙවන උපලේඛන හා අනෙකුත් පරිශිෂ්ඨයන් සම්බන්ධ දැනුම පරීක්ෂා කිරීම.

05. මෙම චක්‍රලේඛ ලිපිය ඔබ ආයතනයේ සේවය කරන අභ්‍යන්තර විගණන නිලධාරී I ශ්‍රේණියේ නිලධාරීන්ගේ දැන ගැනීමට සලස්වන ලෙස කාරුණිකව ඉල්ලමි.

බී.එස්.ආර්.එම්. විජයරාජ
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

පිටපත - ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත.

බී.එස්.ආර්.එම්. විජයරාජ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
පළාත් සභා සංකීර්ණය-රත්නපුර

## ආදර්ශ අයදුම්පත

## අභ්‍යන්තර විගණන ඒකකයේ අභ්‍යන්තර විගණන නිලධාරී I ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගය

---

01 අයදුම්කරුගේ සම්පූර්ණ නම: -

02 මුලකුරු සමග නම : -
(මයා/මිය/මෙනවිය යනුවෙන් සඳහන් කරන්න)

03 දැනට සේවය කරන ස්ථානයේ රාජකාරී ලිපිනය :-

04 දුරකථන අංකය : - 1. රාජකාරී.............................

2. පෞද්ගලික..........................

05. මුල් පත්වීම් දිනය ; -

06. ජාතික හැඳුනුම්පත් අංකය:-

07. අභ්‍යන්තර විගණන නිලධාරී I ශ්‍රේණියට පත් කළ දිනය :-

08. විභාගයට පෙනී සිටින විෂයය: -

09. විභාගයට පෙනී සිටින මාධ්‍යය:-

10. විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය: -

අයදුම්පතේ සඳහන් ඉහත කරුණු සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය අයදුම්කරුගේ අත්සන

**අයදුම්කරු සේවය කරන ආයතන ප්‍රධානියාගේ සහතිකය**

ඉහත නම් සඳහන් අයදුම්කරු මෙම කාර්යාලයේ සේවය කරන අභ්‍යන්තර විගණන නිලධාරී I ශ්‍රේණියේ නිලධාරියෙකු බවත්, ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති අයෙකු බවත්, ඔහු/ඇය මා ඉදිරියේදී මෙම අයදුම්පත්‍රයේ අත්සන් තැබූ බවත් මින් සහතික කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන
දිනය - (කරුණාකර නිල මුද්‍රාව තබන්න)